# ඔබේ අදහස්
# අපට කියන්න

# පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය

## පළාත් පාලන ආයතනවලින් අය කරනු ලබන
## බදු, බලපත්‍ර ගාස්තු සහ වෙනත් ගාස්තු සම්බන්ධයෙන්
## මහජන අදහස් කැඳවීම

පළාත් පාලන ආයතන විසින් අය කරනු ලබන විවිධ බදු හා ගාස්තු පිළිබඳ නියාමනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්ගේ සභාපතිත්වයෙන් යුතු ජාතික මට්ටමේ කමිටුවක් පත්කොට ඇත.

පළාත් පාලන ආයතන විසින් අය කරනු ලබන බදු, බලපත්‍ර ගාස්තු හා වෙනත් ගාස්තුවල පවතින විෂමතා පිළිබඳ සොයා බලා ජාතික ප්‍රතිපත්තියක් තුළින් ඒ සඳහා විසඳුම්, යෝජනා ලබා දීමට බලාපොරොත්තු වේ.

එබැවින්, පහත ශීර්ෂ යටතේ මෙහි දක්වා ඇති ආදර්ශ ආකෘතිය පදනම් කර ගනිමින් අපේක්ෂිත තොරතුරු පහත සඳහන් කර ඇති ලිපිනයට කමිටු ලේකම් වෙත **2018.07.25** වන දිනට පෙර ඉදිරිපත් කරන ලෙස සියලුම මහජනතාව වෙත කාරුණිකව දන්වා සිටිනු ලැබේ.

ලේකම්
පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය

**ශීර්ෂ:**

1. වරිපනම් බදු
2. අක්කර බදු
3. කසල බදු
4. ජල බදු
5. විනෝද බදු
6. කර්මාන්ත බදු
7. ව්‍යාපාර බදු
8. සංවර්ධනය නොකළ ඉඩම් මත බදු
9. ඇතැම් ඉඩම් විකිණීම මත බදු
10. ගෙවල් කුලී
11. කඩ කුලී
12. වෙළඳ අයිතිය බදු දීම
13. බදු කුලී
14. කුලියට දීම්
15. වෙළඳ බලපත්‍ර ගාස්තු
16. වෘත්තීය බලපත්‍ර ගාස්තු
17. වාහන බලපත්‍ර (රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද)
18. විශේෂ බලපත්‍ර ගාස්තු
19. පරිසර ආරක්ෂණ බලපත්‍ර
20. සමාජ ශාලා සඳහා බලපත්‍ර
21. වෙන්දේසිකරුවන් හා බ්‍රෝකර්වරුන් සඳහා බලපත්‍ර
22. ඛනිජ තෙල් ගබඩා කිරීම්, සහතික සහ පරීක්ෂණ ගාස්තු
23. හදිසි සේවා සඳහා ගාස්තු
24. ආදාහනාගාර ගාස්තු
25. ගලි බවුසර් සේවා ගාස්තු
26. වෙනත් සේවා ගාස්තු
27. වරෙන්තු ගාස්තු
28. උසාවි දඩ
29. පොලී (ස්ථාවර තැන්පත් පොලී)
30. මුද්දර ගාස්තු (ඔප්පු හා ගිවිසුම් මත)
31. සේවක ණය පොලී
32. පරිපාලන ප්‍රතිපූර්ණය
33. සාමූහික ආධාර
34. සේවා සඳහා ආධාර
35. මූලධන ආධාර
36. ණය
37. මූලධන වත්කම් විකිණීම්
38. වෙනත් මූලධන ලැබීම්
39. ව්‍යාපාරික ස්ථානවලින් කසල බැහැර කිරීමේ ගාස්තු
40. සුසාන භූමියක වළක් බැදීමට ගාස්තු
41. භෂ්මාවශේෂ තැන්පත් කිරීමේ භූමියේ ඉඩකඩ /කුටීර ඉඩකඩ ගාස්තු
42. ආකෘති පත්‍ර ගාස්තු

**ආදර්ශ ආකෘතිය:**

පළාත: ............................ දිස්ත්‍රික්කය: ............................ ඔබ අයත් පළාත් පාලන ආයතනය: ............................

| බදු, බලපත්‍ර ගාස්තු හා වෙනත් ගාස්තු | ගැටලු | විසඳුම් / යෝජනා |
|---|---|---|
| උදා: වරිපනම් බදු | | |
| | | |
| | | |

**යෝජනා එවිය යුතු පිළිවෙළ:**

- සරලව, පැහැදිලිව, නිරවුල්ව හා කෙටියෙන් ඔබේ ගැටලු හා විසඳුම් යෝජනා ඉදිරිපත් කරන්න.
- ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි **"පළාත් පාලන ආයතන විසින් අයකරනු ලබන බදු, බලපත්‍ර ගාස්තු හා වෙනත් ගාස්තු"** යනුවෙන් සඳහන් කරන්න.
- ලැබෙන මෙම යෝජනා පිළිබඳව අධ්‍යනය කර අවශ්‍ය වුවහොත් ඔබ කැඳවීමට අදහස් කරන බැවින්, ඔබේ නම, ලිපිනය සහ දුරකථන අංකය සඳහන් කරන්න.


**ජී.එස්.කේ. කන්නන්ගර**
**අතිරේක ලේකම් (පළාත් සභා සහ පළාත් පාලන)**
**(කමිටු ලේකම්)**
**පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය**
**අංක 330, යූනියන් පෙදෙස, කොළඹ 02.**

**011-2305326 / 27 සේවා දිගුව 235**

**gsk@pclg.gov.lk**